# දුතියවග්ගො

## 3. 2. 1.

### [ පුඤ්ඤකිරියවත්ථු සුත්තං ]

60. වුත්තං හෙතං භගවතා. වුත්තමරහතා'ති මෙ සුතං:

1. තීණිමානි භික්ඛවෙ පුඤ්ඤකිරියවත්ථූනි. කතමානි තීණි? දානමයං පුඤ්ඤකිරියවත්ථු, සීලමයං පුඤ්ඤකිරියවත්ථු, භාවනාමයං පුඤ්ඤකිරියවත්ථු. ඉමානි ඛො භික්ඛවෙ තීණි පුඤ්ඤකිරියවත්ථූනී'ති.

එතමත්ථං භගවා අවොච තත්ථෙතං ඉති වුච්චති:

2. "පුඤ්ඤමෙව සො සික්ඛෙය්‍ය ආයතග්ගං සුඛුද්‍රයං
දානඤ්ච සමචරියඤ්ච මෙත්තචිත්තඤ්ච භාවයෙ.

3. එතෙ ධම්මෙ භාවයිත්වා තයො සුඛසමුද්දයෙ
අබ්‍යාපජ්ඣං[1] සුඛං ලොකං පණ්ඩිතො උපපජ්ජතී"ති.

අයම්පි අත්ථො වුත්තො භගවතා. ඉති මෙ සුත්තන්ති.

## 3. 2. 2.

### [ චක්ඛුසුත්තං. ]

61. වුත්තං හෙතං භගවතා. වුත්තමරහතා'ති මෙ සුතං:

1. තීණිමානි භික්ඛවෙ චක්ඛූනි. කතමානි තීණි? මංසචක්ඛු, දිබ්බචක්ඛු, පඤ්ඤාචක්ඛු'ති. ඉමානි ඛො භික්ඛවෙ තීණි චක්ඛූනී'ති.

එතමත්ථං භගවා අවොච. තත්ථෙතං ඉති වුච්චති:

2. "මංසචක්ඛු දිබ්බචක්ඛු පඤ්ඤාචක්ඛු අනුත්තරං
එතානි තීණි චක්ඛූනි අක්ඛාසි පුරිසුත්තමො.

3. මංසචක්ඛුස්ස උප්පාදො මග්ගො දිබ්බස්ස චක්ඛුනො
යතො ඤාණං උදපාදි පඤ්ඤාචක්ඛු අනුත්තරං
තස්ස චක්ඛුස්ස පටිලාභා සබ්බදුක්ඛා පමුච්චතී"ති.

අයම්පි අත්ථො වුත්තො භගවතා. ඉති මෙ සුත්තන්ති.

---

1 අබ්‍යාපජ්ජං, මජසං.

# දෙවෙනි වර්ගය

## 3. 2. 1.

## [ පුණ්‍යක්‍රියාවස්තු සූත්‍රය ]

60. භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය වදාරණ ලද්දේ ය. අර්හත් වූ බුදුරදුන් විසින් මෙය වදාරණ ලද්දේ ය. මා විසින් මෙසේ අසන ලදී:

1. මහණෙනි, මේ පුණ්‍යක්‍රියාවස්තුහු තිදෙනෙක් වෙත්. කවර තිදෙනෙක් ද යත්: දාන, ශීල, භාවනා ය. මහණෙනි, මේ පුණ්‍යක්‍රියාවස්තුහු තිදෙනයහ.

මේ කරුණ භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක. එහි මේ අර්ථය (ගාථා-වශයෙන්) මෙසේ කියනු ලැබේ:

2. "තමහට වැඩ කැමැති යම් කුලපුත්‍රයෙක් වේ නම් හේ මතු උතුම් සැප විපාක ඇති තුන් පින්කිරියවත්හි හික්මෙන්නේ ය. දානය ද, සම හැසිරීම ද, මෛත්‍රීසහගත සිත ද වඩන්නේ ය.

3. සැප අනුසස් ඇති මේ (කුශල) ධර්ම තුන වඩා නුවණැත්තේ නිදුක් වූ සැප ඇති බඹලොව උපදී."

මේ කරුණ ද භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලදී. මෙසේ මා විසින් අසන ලදී.

## 3. 2. 2.

## [ චක්ඛුස්සූත්‍රය. ]

61. භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය වදාරණ ලද්දේ ය. අර්හත් වූ බුදුරදුන් විසින් මෙය වදාරණ ලද්දේ ය. මා විසින් මෙසේ අසන ලදී:

1. මහණෙනි, චක්ෂුස්හු තිදෙනෙක් වෙත්. කවර තිදෙනෙක් ද යත්: මසැස, දිවැස, පැණැස ය. මහණෙනි, මේ චක්ෂුස්හු තිදෙන වෙත්.

භගවත්හු මෙ කරුණ වදාළහ. එහි මේ අර්ථය (ගාථා වශයෙන්) මෙසේ කියනු ලැබේ:

2. "පුරුෂොත්තම වූ බුදුරදහු මසැස දිවැස නිරුත්තර වූ පැණැස (යන) තෙ ඇස වදාළහ.

3. මසැසෙහි පැවැත්ම (ඉපැත්ම) දිවැසට කාරණ යි. යම් විටෙක නිරුත්තර ප්‍රඥාචක්ෂුස වූ ආස්‍රවක්ෂය ඥානය පහළ වී ද, ඒ ඇස ලැබීමෙන් සියලු දුකින් මිදේ."

මේ අරුත ද භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලදී. මෙසේ මා විසින් අසන ලදී.